**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 07 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ එකතුව රු. 295,700 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ ශේෂය සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු ගිණුම් 10 කට අදාලව සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු. 128,091 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ගිවිසුම් අත්සන් කරන ලද නමුත් වැඩ ආරම්භ කර හෝ නොමැතිව ගිවිසුම් කාලය ඉක්මවා තිබූ කර්මාන්ත 02 ක් සඳහා එකතුව රු. 991,869 ක් ණයහිමි වෙන්කිරීම් කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) පළාත් සභා ප්‍රතිපාදන මත සිදු කරන ලද තෙලිස්සකෙටුඅතුර මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා ලැබිය යුතු රු. 187,327 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ නිම කරන ලද කර්මාන්ත 02 කට අදාලව ණයහිමි අයි වෙන්කිරීම් එකතුව රු. 1,326,946 ක් ණයහිමි ගිණුමෙන් ඉවත් කල යුතු වුවද, රු. 1,194,651 ක් පමණක් ඉවත් කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමි ගිණුමේ ශේෂය රු. 132,295 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 ලැබියයුතු ගිණුම්

සේවක ණය ලේඛනය අනුව සේවයෙන් පහකිරීම, සේවය අත්හිටුවීම, ස්ථාන මාරු ලැබීම, මියයාම සහ විශ්‍රාම යාම හේතුවෙන් අයවීම් හිඟහිට තිබුණු එකතුව රු. 97,380 ක ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

### 1.3.3 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 03 කට අදාල ධාවන සටහන් වර්ෂ 01 සිට වර්ෂ 02 දක්වා කාලයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 11 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය<br>IV (ආ) කොටසේ අංක 05 යටතේ ඇති අතුරු ව්‍යවස්ථාව | අනවසර ඉදිකිරීම් ලේඛනයේ සඳහන් ඉදිකිරීම් 23 ක් ඉවත් කරගන්නා ලෙසට හෝ නීත්‍යානුකූල කර ගන්නා ලෙසට ලිඛිත දැනුම් දීම් සිදුකර ඇතත්, 2018 අප්‍රේල් වනවිටත් එම ඉදිකිරීම් ඉවත් කරගෙන හෝ නීත්‍යානුකූල කරගෙන නොතිබුණු බැවින් අදාල ඉදිකිරීම් ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,475,978 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,889,563 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,223,607 | 6,419,784 | 6,093,202 | 3,101,940 | 2,912,219 | 6,872,398 | 4,589,686 | 2,948,339 |
| කුලී | 7,850,458 | 7,163,848 | 7,106,582 | 405,952 | 8,443,567 | 6,767,896 | 6,346,572 | 369,572 |
| බලපත්‍ර ගාස්තු | 1,153,200 | 1,410,043 | 1,459,693 | - | 1,169,200 | 1,172,157 | 1,114,407 | - |
| වෙනත් ආදායම් | 14,335,487 | 14,919,263 | 10,651,425 | 18,101,766 | 10,592,466 | 9,875,095 | 10,560,263 | 11,453,969 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු ආදායම් විෂයයේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 27 කින් වැඩි වී තිබූ අතර වරිපනම් බදු, බදු කුලී, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 02, සියයට 09, සියයට 16, සියයට 87, සියයට 05 හා සියයට 18 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

**(අ) වරිපනම්**

2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 2,953,562 ක් වූ අතර, ඒ තුල වර්ෂ 03 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 12,136 කින් අයවිය යුතු එකතුව රු. 53,778 ක් පැවතුණි. එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

**(ආ) අක්කර බදු**

2017 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 80,047 ක් වූ අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා පැරණි ඒකක 65 කින් අයවිය යුතු එකතුව රු. 56,437 ක් පැවතුණි.

### 2.2.4 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අක්කර 02 ක් පමණ වූ සභාව සතු බලවින්න ගොවිපලෙහි ගම්මිරිස් සහ පොල් වගා වලින්, 2017 ජනවාරි සිට සැප්තැම්බර් 30 දින දක්වා ආදායම පිළිවෙලින් රු. 279,263 ක් සහ රු. 20,280 ක් විය. 2017 මාර්තු මාසයෙන් පසුව පොල් එලදාව නෙලා නොතිබුණු අතර, ගම්මිරිස් වගාව ද නිසි පරිදි නඩත්තු නොකරන බව ස්ථානීය පරීක්ෂාවේ දී අනාවරණය විය. ප්‍රමාණවත් සේවක පිරිසක් යොදවා මනා අධීක්ෂණයක්

යටතේ වගා කටයුතු පවත්වාගෙන යාම තුලින් ඉහල ආදායමක් උපයාගැනීමට හැකියාව තිබියදීත් සභාව ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) රක්වාන ප්‍රදේශයේ මාළු ලැලි 02 කින් 2015 හා 2016 වර්ෂයන්ට අදාලව අයවිය යුතු එකතුව රු. 155,075 ක් වූ හිඟ කුලිය අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. මාළු කඩ දෙක පවත්වාගෙන ගිය පුද්ගලයින් විසින් එම දේපල වෙනත් පාර්ශවයකට විකුණා තිබුණ ද, අදාල දේපලෙහි නිරවුල් අයිතිය තහවුරු කිරීමට සභාව අපොහොසත් වීම හේතුවෙන් ඒ පිළිබඳ නීතිමය පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 අගෝස්තු සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව ඇඹිලිපිටිය හා පැල්මඩුල්ල දිසා අධිකරණ වලින් අයවිය යුතු උසාවි දඩ මුදල් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2017 වර්ෂය වෙනුවෙන් හා රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2015 වර්ෂයේ සිට 2017 දක්වා වූ වර්ෂ 03 ක් වෙනුවෙන් අයවිය යුතු මුද්දර බදු ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) වාර්ෂික සැලසුම් වලින් බැහැර ක්‍රියාකාරකම්**

2017 වර්ෂයේ අයවැය ලේඛනය අනුව දළ ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු. 5,350,000 ක් වූ සංවර්ධන යෝජනා 11 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ඉන් කිසිඳු ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුල ඉටු කර නොතිබුණු අතර, ඒ වෙනුවට ඇස්තමේන්තුගත පිරිවැය රු. 5,790,864 ක් වූ වෙනත් සංවර්ධන ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද, පළාත් පාලන කොමසාරිස් විසින් අනුමත කර එවන කර්මාන්ත පමණක් ක්‍රියාත්මක කිරීමට සිදුවීම හේතුවෙන් අයවැය ලේඛනයට ඇතුලත් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට සභාවට නොහැකි වූ බව විගණනයට දන්වා තිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රදේශයේ කසළ එකතු කිරීම සම්බන්ධයෙන් කාලසටහනක් පිළියෙල කර තිබුණද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් මාර්ගය දෙපස විශාල වශයෙන් කසළ එකතු වී ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී

නිරීක්ෂණය විය. කසළ එකතු කිරීමේදී හා ඒවා බැහැර කිරීමේදී දිරන හා නොදිරන වශයෙන් වෙන් කිරීමට පියවර ගෙන නොතිබූ අතර, ඒවා අවිධිමත් ලෙස වලවල් කපා බැහැර කිරීම සිදු කරමින් පැවතුණි. කසළ බැහැර කිරීමට යොදාගෙන තිබූ අක්කර 03 ක පමණ භූමිය සම්පූර්ණයෙන් උපයෝජනය වන පරිදි කසළ කළමනාකරණය සඳහා විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ii) කසළ බැහැර කරන ස්ථානය සභාව සතු ඉඩමක් නොවූ අතර, එම ඉඩම සභාවට පවරා ගැනීමේ කටයුතු මන්දගාමී ස්වභාවයක පැවතුණි. කසළ බැහැර කරන ස්ථානය සඳහා ලබාගත යුතු පරිසර බලපත්‍රය ලබාගැනීමට අදාල පාරිසරික නිර්දේශය 2013 සැප්තැම්බර් 13 දින ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අදාල නිර්දේශ ක්‍රියාත්මක කර පරිසර බලපත්‍රය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂ කිහිපයක සිට පරිසරයට අහිතකර ලෙස බලපාන අයුරින් කසළ බැහැර කිරීම සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(iii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

රක්වාන පොළ පිහිටි භූමිය විධිමත් පරිදි සභාව වෙත පවරා ගෙන නොතිබුණු අතර, ඒ වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණි. ඉතාම අබලන් හා අපිරිසිදු තත්ත්වයක පැවති එම පොළ ආහාරපාන අලෙවියට නුසුදුසු තත්ත්වයක පවතින බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. පළාත් පාලන ආයතන වල ප්‍රජා යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2017 යටතේ පොළ නවීකරණය කිරීම සඳහා 2017 මාර්තු 22 දිනැති ලිපිය මඟින් පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් අනුමැතිය ඉල්ලා තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත සම්බන්ධයෙන් නීතිමය කටයුතු කලයුතු වුවත් එම බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීමට සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරානොගත් වත්කම්

2017 අයවැය ලේඛනයට අනුව සභාව සතු සුසාන භූමි 58 ක් පැවතියද, ඉන් 55ක් මැනුම් කටයුතු කර විධිමත් පරිදි සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

### 3.4.2 නිෂ්ක්‍රීය වත්කම්

2016 අප්‍රේල් මාසයෙන් පසු භාවිතයෙන් තොරව තිබූ සභාව සතු ට්‍රැක්ටරයක් 2017 නොවැම්බර් 20 දින වනවිටත් අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකර ක්‍රියාකාරී මට්ටමට පත්කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 26 ක් සඳහා සලසා තිබුණු රු. 9,250,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී පැවතුණි.

(ආ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනයෙන් සියයට 86 ත් සියයට 97 අතර පරාසයක පැවතුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | වත්කම් වටිනාකම් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම |
| | | (iii) | ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | කසළ බැහැර කිරීමේ ක්‍රමවේදය පරිසර හිතකාමී නොවීම |